ආ.වෛ.ස/පා/1961/31(62)/06

## 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය
## ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය අනුව ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා ගනු ලබන අතිරේක සුදුසුකම් නාම ලේඛනයේ ඇතුළත් කර ගත යුතුය. මෙම සුදුසුකම් ආයුර්වේද වෛද්‍ය සභාව පිළිගනු ලැබිය යුතු අතර අනතුරුව වෛද්‍ය නාම ලේඛනයට එය ඇතුළත් කරනු ලැබීමෙන් අනතුරුව එම සුදුසුකම් නීත්‍යානුකූලව සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමේ හිමිකම් ලැබෙනු ඇත.

එබැවින් ඔබ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීමෙන් පසුව ලබා ගත් යම් පිළිගත හැකි අතිරේක සුදුසුකම් ඇත්නම් මේ සමඟ ඇති ආකෘති පත්‍රය සම්පූර්ණ කර පහත දැක්වෙන ලිපිලේඛන හා මෙම ලිපිය සමඟ එවීමට කටයුතු කරන්න.

<u>අවශ්‍ය ලේඛන</u> :

1. නාමලේඛනයට ඇතුළත් කළ යුතු අතිරේක සුදුසුකම සහිත සහතිකයේ සහතික කරන ලද ජායා පිටපත
2. අතිරේක සුදුසුකම ලබාගත් **"විෂය ක්ෂේත්‍රය"** තහවුරුවන සේ අදාළ ආයතනය මගින් නිකුත් කරන ලද සහතිකයේ ජායා පිටපතක්
3. ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ජායා පිටපත
4. ජාතික හැඳුනුම්පත් ජායා පිටපත

මෙම ලේඛන සම්පූර්ණ වූ පසු ඔබගේ අතිරේක සුදුසුකම සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව දන්වමි. **( උපදෙස් සඳහා පසු පිට බලන්න )**

වෛද්‍ය සුනිල් පී.අතපත්තු
ලේඛකාධිකාරී,

| **කාර්යාලීය ප්‍රයෝජනය සඳහා** | | | |
|---|---|---|---|
| වෛද්‍ය සභාවේ ලියාපදිංචි අංකය | | ජාතික හැඳුනුම්පත | |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය | | අතිරේක සුදුසුකම සහිත සහතිකය | |
| අතිරේක සුදුසුකම | | එම සුදුසුකම ලබාගත් දිනය | |
| අතිරේක සුදුසුකම සභාව අනුමත කළ දිනය | | මුදල හා රිසිට්පත් අංකය | |
| නාම ලේඛනයට අතිරේක සුදුසුකම ඇතුළත් කළ දිනය | | සාරානුකූල සහතික පිටපත නිකුත් කළ දිනය | |

ආ.වෛ.ස/අ.ති/01

උපදෙස් :

- මෙය අදාළ වන්නේ අධ්‍යාපනික, වෘත්තීය හා ශාස්ත්‍රීය සුදුසුකම් සම්බන්ධයෙන් පමණි.
- එම සුදුසුකමට අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න.
- කරුණාකර, විවිධ ආයතන හෝ සංගම් මගින් පිරිනමන ලද සම්මාන හෝ සන්නස් පත්‍ර ආදිය හෝ තනතුරු, නිලනාම, පදවි ආදිය පිළිබඳ විස්තර එවීමෙන් වළකින්න.
- මේ සඳහා ඉදිරිපත් කරන තොරතුරු සත්‍ය හා නිවැරදි විය යුතු අතර යම් හෙයකින් ඒවා ව්‍යාජ ඒවා බව පසුව සොයාගනු ලැබුව හොත් 1973 විනය නියෝග යටතේ විනයානුකූල පියවර ගනු ලැබේ.
- එක් එක් අතිරේක සුදුසුකම සඳහා වෙන වෙනම අකෘති පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
- එම අතිරේක සුදුසුකම් ඇතුළත් කළ සාරානුකූල සිංහල සහතික පිටපතක් ලබාගැනීමේ ගාස්තුව රු.1000/- කි.
- අතිරේක සුදුසුකම් ඇතුළත් කර සාරානුකූල සිංහල සහතික පිටපත හා එහි ඉංග්‍රීසි පරිවර්තන පිටපත යන සහතික පත්‍ර දෙකම නිකුත් කිරීමේ ගාස්තුව රු.1750/- කි.

**( ආයුර්වේද වෛද්‍ය සභාව අනුමත නොකළ යම් සුදුසුකමක් හෝ ඒ බව හැඟවෙන විස්තරයක් හෝ එකතුවක් වෘත්තිය කටයුතු සඳහා සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීම වෘත්තීය විෂමාචාරයකි. )**

**විශේෂයි :- කරුණාකර මෙම සුදුසුකම ආයුර්වේද වෛද්‍ය සභාව පිළිගත් බව ඔබට දන්වන තෙක් ගාස්තු එවීමෙන් වළකින්න.**

# 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය
# ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම

❖ නම :

❖ ලිපිනය :

❖ සේවා ස්ථානය හෝ වෘත්තිය ලිපිනය :

❖ ලියාපදිංචි අංකය : දිනය :

❖ අංශය : ආයුර්වේද ☐ සිද්ධ ☐ යුනානි ☐ පාරම්පරික ☐

❖ විෂය :

❖ ලියාපදිංචිය ලබා ගන්නා විට තිබූ මූලික සුදුසුකම : *උපාධි ☐ *අභිඥානපත්‍ර ☐ *සහතික ☐ පාරම්පරික ☐

*නාමය : ( සිංහල ) ( ඉංග්‍රීසි අකුරු )

❖ දැනට ඇතුළත් කර ගැනීමට අපේක්ෂා කරන අතිරේක සුදුසුකම් :
( √ ලකුණ යොදන්න )

| | | | |
|---|---|---|---|
| අභිඥාන පත්‍ර ( Diploma ) | ☐ | වාචස්පති ( M.D.) / (M.S) | ☐ |
| උපාධි ( Digree ) | ☐ | දර්ශනශූරි/දර්ශනවිශාරද පශ්චාත් උපාධි ( Ph.D. ) | ☐ |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා( PG Dip. ) | ☐ | විද්‍යාවිශාරද පශ්චාත් උපාධිය( D.Sc. / D.Lit. ) | ☐ |
| විද්‍යාපති පශ්චාත් උපාධිය (M.Sc.) | ☐ | දර්ශනපති පශ්චාත් උපාධිය ( M.Phil. ) | ☐ |

❖ එම සහතිකය පිරිනැමූ ආයතනය :

❖ පාඨමාලාවේ කාලය : සිට දක්වා

❖ විෂය ක්ෂේත්‍රය :

❖ පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කළේ නම් එහි මාතෘකාව :

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

අත්සන :...............................................................

දිනය :.................................................................

ආ.වෛ.ස/පා/1961/31(62)/06 2010.04.05

## 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය
## ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම

උක්ත කරුණට අදාළව ඔබ විසින් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත ඉදිරිපත් කර ඇති අයැදුම්පත හා බැඳේ.

එහි සඳහන් අතිරේක සුදුසුකම වෛද්‍ය නාම ලේඛනයට ඇතුළත් කිරීම සඳහා සුදුසු බවට වෛද්‍ය සභාවේ අනුමැතිය ලැබී ඇති බව දන්වන අතර එම අතිරේක සුදුසුකම ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි නාමලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කළ යුතුව ඇති බවත් මෙයින් දැනුම් දෙමි.

**මෙම සුදුසුකම නාමලේඛනයට ඇතුළත් කර, අදාළ සහතික පත්‍රය ලබා ගැනීමෙන් පසුව පමණක් එම සුදුසුකම් නීත්‍යානුකූලව සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමේ හිමිකම ඔබ වෙත ලැබෙනු ඇත.**

| | |
|---|---|
| **වෛද්‍යවරයාගේ නම -** | කනන්කේ හේවාආරච්චිලාගේ ආශා ශිරෝමි ජයසිංහ |
| **සභාව පිළිගත් අතිරේක සුදුසුකම -** | **Postgraduate Diploma in Counselling** - (PG.Dip.) - Colombo |

**මේ අනුව උක්ත සුදුසුකම වෛද්‍ය නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා එක් සුදුසුකමක් වෙනුවෙන් පහත දැක්වෙන ආකාරයෙන් ගාස්තු ගෙවිය යුතුය.**

- අතිරේක සුදුසුකම් ඇතුළත් කර සාරානුකූල සිංහල සහතික පිටපතක් නිකුත් කිරීමේ ගාස්තුව රු.1000/- ( දහසකි. )
- අතිරේක සුදුසුකම් ඇතුළත් කර සාරානුකූල සිංහල සහතික පිටපත හා එහි ඉංග්‍රීසි පරිවර්තන පිටපත යන සහතික පත්‍ර දෙකම නිකුත් කිරීමේ ගාස්තුව රු.1750/- ( එක්දහස් හත්සිය පනහකි. )
- සහතික ලියාපදිංචි තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා රු.100/- ක මුද්දර ගාස්තුවක් ද ගෙවිය යුතුය.

ඔබගේ අවශ්‍යතාව අනුව, උක්ත වටිනාකම සඳහා ( ලියාපදිංචි තැපැල් ගාස්තු ඇතුළත්ව රු.1100/- හෝ රු.1850/- ) ක් වටිනා මුදල් ඇණවුමක් **"ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය සභාව"** නමින් රැගෙන, පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. මුදල් ඇණවුම් මාරුකරන ස්ථානය **"මහරගම"** ලෙස සඳහන් කළ යුතුය. අවශ්‍ය නම් මෙම මුදල ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයට පැමිණ, මුදලින් ද ගෙවිය හැකිය. **(සැ.යු. - මුදල් ගෙවීමේ දී මෙම ලිපියේ පිටපතක් ද අමුණා එවීම අනිවාර්ය වේ. )**

***වෛද්‍ය සුනිල් පී.අතපත්තු***
***ලේඛකාධිකාරී,***

ආ.වෛ.ස/අ.ති/04

**සභාපත්‍රිකා අංක - 15/18/04**

ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති ඇතුළු
සෙසු සාමාජක භවතුන්ගේ අවධානය සඳහා

**1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය යටතේ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම.**

1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 55(1)(ඇ) වගන්තිය යටතේ ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ඇති පහත නම් සඳහන් වෛද්‍යවරුන් ලියාපදිංචියෙන් පසු ලබා ඇති අතිරේක සුදුසුකම් නාම ලේඛනයට ඇතුළත් කිරීමට සභාවේ අනුමැතිය පතමි.

| අනු අංකය | ලියාපදිංචි අංකය | සම්පූර්ණ නම | වෛද්‍ය සභාවේ දැනට ලබා ඇති සුදුසුකම් හා දිනය | අතිරේක සුදුසුකම | අතිරේක සුදුසුකම ලබා ඇති ආයතනය හා දිනය |
|---|---|---|---|---|---|
| 01. | 5865 | පොන්නම්පලම් රාමනාදන් | D.A.M.S<br>1971.05.20 | Doctor of Philosophy<br>( Ph.D.)<br><br>Doctor of Medicine<br>( Siddha ) | University of Jaffna<br>2004 March 31<br><br>Madurai Kamaraj University<br>1991 October 30 |

සකස් කළේ. -                                        පරීක්ෂා කළේ.

වෛද්‍ය සුනිල් පී.අතපත්තු
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.
2008.12.09

---

**සභාපත්‍රිකා අංක - 15/18/05**

ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති ඇතුළු
සෙසු සාමාජක භවතුන්ගේ අවධානය සඳහා

**මියගොස් ඇති බව වාර්තා කර ඇති ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නම් ලියාපදිංචි නාමලේඛන වලින් ඉවත් කිරීම.**

1961 අංක 31 දරන ආයුර්වේද වෛද්‍ය සභා පනතේ 81 වගන්තිය ප්‍රකාරව උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන්ගේ නම් ලියාපදිංචි නාමලේඛන වලින් ඉවත් කිරීමට සභාවේ අනුමැතිය පතමි.

| අනු අංකය | ලියාපදිංචි අංකය | අංශය | මියගොස් ඇති දිනය | වෛද්‍යවරයාගේ නම | මියගිය බව දැනුම්දුන් අයගේ විස්තර |
|---|---|---|---|---|---|
| 1. | 8475 | සර්වාංග පාරම්පරික | 2008.11.01 | ජයසිංහ ආරච්චිගේ දොන් ගුණපාල | එස්.ඩබ්.සෙනෙවිරත්න උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් |

සකස් කළේ -

වෛද්‍ය සුනිල් පී.අතපත්තු
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.                                        පරීක්ෂා කළේ -
2008.12.09

ආ.වෛ.ස/පා/1961/31(62)/06 2008.09.09

වෛද්‍ය ඩබ්.යූ.කේ.එස්.සමරතුංග මයා
අංක 468,
හයිලෙවල් පාර,
ගංගොඩවිල,
නුගේගොඩ

**1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 62 වගන්තිය**
**ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීම**

උක්ත කරුණට අදාලව ඔබ විසින් එවා ඇති 2008.09.03 දින දරන ලිපිය හා බැදේ.

ඔබගේ ඉල්ලීම සළකාබැලූ සභාව බරණැස හින්දු විශ්ව විද්‍යාලයෙන් නිකුත් කර ඇති සහතික පත්‍රයේ සදහන් වන Doctor of Medicine in Ayurveda - **M.D (Ay.) Basic Principles ( Sharir Rachana )** විෂය ක්ෂේත්‍රය ඇතුළත් කර අතිරේක සුදුසුකම් ඇතුළත් සහතිකය නිකුත් කිරීමට තිරණය කළ බව දන්වමි.

ඒ අනුව ඔබගේ අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ දී අදාළ විශේෂඥතාවය ඇති විෂය ක්ෂේත්‍රය ඇතුළත් කරීමට හැකි බව දන්වන අතර ඒ සදහා අදාළ ගාස්තුව ගෙවීමට සිදුවනු ඇත. ඒ සදහා 2008.08.29 දිනැතිව ඔබ වෙත එවා ඇති ලිපිය කෙරෙහි අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

**එක් සුදුසුකමක් සදහා පහත දැක්වෙන ගාස්තු ගෙවිය යුතුය.**

- අතිරේක සුදුසුකම් ඇතුළත් කර සාරානුකුල සිංහල සහතික පිටපතක් නිකුත් කිරීමේ ගාස්තුව රු.1000/- ( දහසකි. )

- අතිරේක සුදුසුකම් ඇතුළත් කර සාරානුකුල සිංහල සහතික පිටපත හා එහි ඉංග්‍රීසි පරිවර්තන පිටපත යන සහතික පත්‍ර දෙකම නිකුත් කිරීමේ ගාස්තුව රු.1750/- ( එක්දහස් හත්සිය පනහකි. )

- සහතික ලියාපදිංචි තැපැලෙන් ගෙන්වා ගැනීම සදහා රු.100/- ක මුද්දර ගාස්තුවක් ද ගෙවිය යුතුය.

ඔබගේ අවශ්‍යතාව අනුව, උක්ත වටිනාකම සදහා ( ලියාපදිංචි තැපැල් ගාස්තු ඇතුළත්ව රු.1100/- හෝ රු.1850/- ) ක් වටිනා මුදල් ඇණවුමක් **"ලේඛකාධිකාරී, ආයුර්වේද වෛද්‍ය සභාව"** නමින් රැගෙන, පහත සදහන් ලිපිනයට එවිය යුතුය. මුදල් ඇණවුම් මාරුකරන ස්ථානය **"මහරගම"** ලෙස සදහන් කළ යුතුය. අවශ්‍ය නම් මෙම මුදල ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයට පැමිණ, මුදලින් ද ගෙවිය හැකිය. **(සැ.යු. - මුදල් ගෙවීමේ දී මෙම ලිපියේ පිටපතක් ද අමුණා එවීම අනිවාර්ය වේ. )**

***වෛද්‍ය සුනිල් පී.අතපත්තු***
***ලේඛකාධිකාරී,***